# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 1964/20 – 2016 අප්‍රේල් 27 වැනි බදාදා – 2016.04.27

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


# III වැනි කොටස – ඉඩම්

## ඉඩම් රජයට ගැනීම පිළිබඳ දැන්වීම්

### ඉඩම් අත්කර ගැනීමේ පනත (460 වැනි පරිච්ඡේදය)

39 (1) වැනි වගන්තිය යටතේ ප්‍රත්‍යාදිෂ්ඨ කිරීම

ඉඩම් අත්කර ගැනීමේ පනතේ 38 වැනි වගන්තිය (අ) අතුරු විධානය යටතේ පනවන ලද්දාවූ ද අංක 1904/36 හා 2015.03.04 වැනි දින දරන රජයේ අති විශෙෂ ගැසට් පත්‍රයේ පළ කරන ලද්දා වූ ද 2015 අංක 50 හා 2015.02.12 දින දරන ආඥාවේ සවිස්තරව දැක්වෙන ඉඩම් කොටස ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජය වෙත පැවරී තිබේ. එනමුත් මේ කියන ලද ඉඩම් කොටස් අතරින් මෙහි පහත විස්තර වන ඉඩම් කොටස්වල භුක්තිය ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජය වෙනුවෙන් තවම භාර ගෙන නැත. එබැවින් ඉඩම් අමාත්‍ය ජෝන් ඇන්තනී එම්මානුවෙල් අමරතුංග වන මම ඉඩම් අත්කර ගැනීමේ පනතේ 39(1) වැනි වගන්තිය යටතේ මා හට පැවරී ඇති බලතල අනුව අංක 1904/36 හා 2015.03.04 වැනි දින දරන රජයේ අති විශෙෂ ගැසට් පත්‍රයේ පළ කරන ලද ඉහත සඳහන් 2015 අංක 50 හා 2015.02.12 වැනි දින දරන ආඥාව මෙම නියමය මගින් ප්‍රත්‍යාදිෂ්ඨ කරමි.

ජෝන් ඒ. ඊ. අමරතුංග,
ඉඩම් අමාත්‍ය.

මගේ අංකය: 4-3/4/2014CR/24.
ප්‍රා.ලේ. අංකය: WEG/LAN/LI/ACQ/43-II.
2016 අප්‍රේල් මස 18 වැනි දින,
ඉඩම් අමාත්‍යාංශය,
''මිහිකත මැදුර'',
රජමල්වත්ත පාර,
බත්තරමුල්ල.

උපලේඛනය

දකුණු පළාතේ, මාතර දිස්ත්‍රික්කයේ වැලිගම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, බණ්ඩරමුල්ල නමැති ගමේ පිහිටි මාතර දිස්ත්‍රික් ජ්‍යෙෂ්ඨ මැනුම් අධිකාරී විසින් පිළියෙල කරන ලද අංක එම්ආර්/ඩබ්එල්ජී/2014/220 හා 2014.09.17 දිනැති ප්‍රගමන අනුරේඛනයේ දැක්වෙන පහත නම්වලින් හා ප්‍රමාණයන්ගෙන් යුක්ත ඉඩම් කැබැල්ලට මායිම්:

01. කැබලි අක්ෂර 'ඒ' – ගිරාගලකන්ද – ප්‍රමාණය: **හෙක්. 0.1895ක් පමණ**

උතුරට සහ නැගෙනහිරට: මුහුද; දකුණට: මුහුද සහ කැබලි අක්ෂර බී; බටහිරට: මුහුද.

05 - 264

---

### ඉඩම් අත්කර ගැනීමේ පනත (460 වැනි පරිච්ඡේදය)

39 (1) වැනි වගන්තිය යටතේ ආඥාව අවලංගු කිරීම

ඉඩම් අත්කර ගැනීමේ පනතේ 38 වැනි වගන්තිය (අ) අතුරු විධානය යටතේ පනවන ලද්දාවූ ද අංක 1796/17 හා 2013.02.07 වැනි දින දරන රජයේ අති විශෙෂ ගැසට් පත්‍රයේ පළ කරන ලද අංක 1807/24 හා 2013.04.26 දිනැතිව රජයේ අති විශෙෂ ගැසට් පත්‍රයේ පළ කරන ලද්දාවූ 2012 අංක 40 දරන ආඥාවෙන් සංශෝධනය කර ඇති 2013 අංක 40 හා 2013.02.05 වැනි දින දරන ආඥාවේ ඉඩම් කැබලි 01ක් ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජය වෙත පැවරී තිබේ. එනමුත් මේ කියන ලද ඉඩම් කොටස් වල භුක්තිය ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජය වෙනුවෙන් තවම භාර




*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය www.documents.gov.lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

ගෙන නැත. එබැවින්, ඉඩම් අමාත්‍ය ජෝන් ඇන්තනී එම්මානුවෙල් අමරතුංග වන මම ඉඩම් අත්කර ගැනීමේ පනතේ 39(1) වැනි වගන්තිය යටතේ මා හට පැවරී ඇති බලතල අනුව අංක 1796/17 හා 2013.02.07 වැනි දින දරන රජයේ *අති විශෙෂ ගැසට් පත්‍රයේ* පළ කරන ලද ඉහත සඳහන් 2013 අංක 40 හා 2013.02.05 වැනි දින දරන ආඥාවේ සඳහන් හා අංක 1807/24 හා 2013.04.26 වැනි දින දරන රජයේ *අති විශෙෂ ගැසට් පත්‍රයේ* පළ කරන ලද සංශෝධිත ඉහත සඳහන් 2012 අංක 40 දරන ආඥාවේ පහත උපලේඛනයේ සඳහන් කැබලි අංක 01 දරන ඉඩම් කොටස මෙයින් ප්‍රත්‍යාදිෂ්ඨ කරමි.

ජෝන් ඒ. ඊ. අමරතුංග,
ඉඩම් අමාත්‍ය.

මගේ අංකය: 4/3/10/2012/LRB/17.
ඉඩම් අත්කර ගැනීමේ නිලධාරි අංකය: WGSWD&EIP/ACQ/MH/03.
2016 අප්‍රේල් මස 18 වැනි දින,
ඉඩම් අමාත්‍යාංශය,
''මිහිකත මැදුර'',
රජමල්වත්ත පාර,
බත්තරමුල්ල.

උපලේඛනය

බස්නාහිර පළාතේ, කොළඹ දිස්ත්‍රික්කයේ මහරගම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, ගංගොඩවිල ගමේ පිහිටි සර්වේයර් ජනරාල් විසින් පිළියෙල කරන ලද අංක CO/DSO/2012/329 හා 2012.11.02 වැනි දින දරන පූගමන අනුරේඛනයේ කැබලි අංක 1 වශයෙන් පෙන්නුම් කර ඇති ප්‍රමාණයෙන් හෙක්. 0.5227ක් පමණ වන ඉඩම් කොටසට මායිම්:

01. **කැබලි අංක 1 – ඉඩමේ නම නොදනී – ප්‍රමාණය: හෙක්. 0.5227**

උතුරට: අත්හරින ලද කුඹුර; නැගෙනහිරට: පරණ කැස්බෑව පාර සහ අත්හරින ලද කුඹුර; දකුණට සහ බටහිරට: අත්හරින ලද කුඹුර.

05 - 265

## ශුද්ධි පත්‍රිකාව

### ඉඩම් අත්කර ගැනීමේ පනත (460 වැනි පරිච්ඡේදය)

### 38 වැනි වගන්තිය (අ) අතුරු විධානය යටතේ ආඥාව

**2015 අංක 167 දරන ආඥාව**

ඉඩම් අත්කර ගැනීමේ පනතේ 38 වැනි වගන්තියේ (අ) අතුරු විධානය යටතේ අංක 1937/9 හා 2015.10.20 දිනැති ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *අති විශෙෂ ගැසට් පත්‍රයේ* පළ කරන ලද 2015 අංක 167 දරන ආඥාවෙහි උපලේඛනයේ කැබලි අංක 33, 43, 46 දරන ඉඩම් කැබලිවල ප්‍රමාණය පිළිවෙලින් හෙක්. 0.0233, 0.0640, 0.0022 ලෙස වැරදි ලෙස සටහන් වී ඇති බැවින් එම ප්‍රමාණ පිළිවෙලින් හෙක්. 0.0016, 0.0023, 0.0077 ලෙස සංශෝධනය විය යුතු බව මෙයින් ප්‍රකාශ කරමි.

ජෝන් ඒ. ඊ. අමරතුංග,
ඉඩම් අමාත්‍ය.

මගේ අංකය: 4/3/6/2014/HW/451(ii).
2016 අප්‍රේල් මස 18 වැනි දින,
ඉඩම් අමාත්‍යාංශය,
''මිහිකත මැදුර'',
රජමල්වත්ත පාර,
බත්තරමුල්ල.

05 – 266

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.